සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 09 - 2024**

## කතෝලික ධර්මය

**කාලය පැය 02 යි**

නම / විභාග අංකයඃ

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව,
   i. 73 කි. ii. 46 කි. iii. 39 කි. iv. 27 කි.

02. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ ග්‍රන්ථ වර්ගීකරණය අනුව හතරවන පොත් කාණ්ඩය,
   i. ප්‍රඥා සාහිත්‍ය ග්‍රන්ථය ii. එළිදරව් සාහිත්‍ය ග්‍රන්ථය
   iii. ඉතිහාස ග්‍රන්ථය iv. දිවැසිවර ග්‍රන්ථය

03. ''කොලොස්සි'' යනු,
   i. ඉතිහාස පොතකි. ii. සන්දේශයකි. iii. ශුභාරංචියකි. iv. පැරණි ග්‍රන්ථයකි.

04. නව ගිවිසුමේ හසුන් 13ක් ලියූ කතුවරයා වන්නේ,
   i. ශුද්ධ වූ ජුවාම්තුමා ය. ii. ශුද්ධ වූ පාවුලුතුමා ය.
   iii. ශුද්ධ වූ ලූක්තුමා ය. iv. ශුද්ධ වූ පේදුරු තුමා ය.

05. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ විශේෂයෙන් සඳහන් වන පුද්ගලයන් දෙදෙනෙකි,
   i. පේදුරුතුමා හා ජාකොබ්තුමා ii. පේදුරුතුමා හා පාවුලුතුමා
   iii. පාවුලුතුමා හා මාක්තුමා iv. පාවුලුතුමා හා ලූක්තුමා

06. ශුද්ධ බයිබලයේ ගීතාවලිය ග්‍රන්ථයට පසුබිම් වී ඇත්තේ,
   i. ඊශ්‍රායෙල් ජනතාවගේ ජනවන්දනාව ය. ii. ඊශ්‍රායෙල් ජනතාවගේ විලාපය ය.
   iii. ඊශ්‍රායෙල් ජනතාවගේ ජීවනෝපායන් ය. iv. ඊශ්‍රායෙල් ජනතාවගේ ආදරය ය.

07. ශුද්ධවර මතෙව් ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නමකි,
   i. ගැලවීමේ ශුභාරංචිය ii. ප්‍රේමයේ ශුභාරංචිය
   iii. දේව රාජ්‍යයේ ශුභාරංචිය iv. දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය

08. ඒදන් උයනේ පදිංචි කළ ආදම් සහ ඒවට දෙවියන් වහන්සේ දුන් අවවාදය වන්නේ,
   i. දින හයක් තුළ නුඹ වැඩ කළ යුතු බවයි.
   ii. හොඳ නරක අවබෝධ කිරීමේ ගසින් නොකෑ යුතු බවයි.
   iii. ගස්වල ගෙඩිකෑම ශරීරයට අහිතකර බවයි.
   iv. උයන වගාකර ආහාර සපයා ගත යුතු බවයි.

09. පාපයේ ප්‍රතිඵල ලෙස පොළොව සාප ලැබීම සම්බන්ධයෙන් සඳහන් වන්නේ,
   i. කායින්ට ය. ii. ඒවට ය. iii. සර්පයාට ය. iv. ආදම්ට ය.

10. පොළවෙන් නිපදවූ අස්වැන්න පඬුරක් වශයෙන් දෙවියන් වහන්සේට පූජා කළේ,
   i. ආබෙල් ය. ii. ආදම් ය. iii. කායින් ය. iv. නෝවා ය.

11. නෝවා කැඳවනු ලබන්නේ,
   i. ඊශ්‍රායෙල් ගැලවුම්කරුවා වශයෙනි.
   ii. පැරණි ගිවිසුමේ ආදිපිතෘවරයෙක් වශයෙනි.
   iii. නව මැවිල්ලක ආරම්භකයා වශයෙනි.
   iv. නව ගිවිසුමේ පළමු දිවැසිවරයා වශයෙනි.

12. ''ධෛර්යවත් බලවත් මනුෂ්‍යය'' යනුවෙන් සමිඳාණන් වහන්සේගේ දූතයා විසින් ආමන්ත්‍රණය කරනු ලබන්නේ,
   i. ගිඩියොන් ය.   ii. දාවිත් ය.   iii. ජොනතන් ය.   iv. සාමුවෙල් ය.

13. නාතාන් දිවැසිවරයා කළ මෙහෙවරකි,
   i. ඌරියාව යුධ පෙරමුණට යැවීම.
   ii. ජොනතන්ව අභිෂේක කිරීම.
   iii. ගිබියොන්හි දී දෙවිඳුන්ට නමස්කාර කිරීම.
   iv. දාවිත් රජතුමාව යහමඟයට යැවීම.

14. ජන්ම පාපය ඉවත්කරනු ලබන්නේ,
   i. ප්‍රසාද ස්නාපනය හරහා ය.
   ii. පූජකවරය හරහා ය.
   iii. ආශිර්වාදකාර බන්ධනය හරහා ය.
   iv. රෝගීන් ආලේපය හරහා ය.

15. මෝසෙස්තුමාගේ නීතිය අනුව කාමමිථ්‍යාචාරය කළ අයට හිමි දඬුවම නම්,
   i. හිසගසා මැරීම   ii. එල්ලා තැබීම   iii. පහර දීම   iv.ගල් ගසා මරා දැමීම.

16. ශුද්ධ වූ අගොස්තීනුතුමා උපත ලැබුවේ,
   i. අප්‍රිකාවේ තාගස්සේ නුවර
   ii. ජුදයේ බෙත්ලෙහෙම් නුවර
   iii. ගලීලයේ නාසරෙත් නුවර
   iv. සිලිසියාවේ තාර්සස් නුවර

17. ජේසුස් වහන්සේ ස්වකීය අපෝස්තුළුවරුන්ට දානය කළ බලයකි,
   i. මළවුන් නැගිටුවීමේ බලය
   ii. මුහුද මත ඇවිදීමේ බලය
   iii. රෝගීන් සුවකිරීමේ බලය
   iv. කුණාටු සංසිඳුවීමේ බලය

18. මහෝපදේශයේ සඳහන් පරිදි අන්තිම ආලේපය යනු,
   i. පාපොච්චාරණය   ii. අභිවෘද්ධියාලේපය   iii. පූජකවරය   iv. රෝගීන් ආලේපය

19. රෝගියෙකුගෙන් පාපොච්චාරණය අසනු ලබන්නේ,
   i. දිව්‍ය සත්ප්‍රසාද ලැබීමට පෙර
   ii. මිය යන්නට පෙර
   iii. ආලේප කිරීමේ පිළිවෙතට පෙර
   iv. රෝගියාට පහසු අවස්ථාවක

20. අපගේ ජීවිතයේ අයිතිය ඇත්තේ,
   i. දෙවියන් වහන්සේට ය.   ii. අපට ය.   iii. දෙමව්පියන්ට ය.   iv. රජයට ය.

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. ශුද්ධ බයිබලයේ අඩංගු එළිදරව් සාහිත්‍යය ග්‍රන්ථ දෙක නම් කරන්න.

ii. සමදර්ශක ශුභාරංචි ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

iii. ගීතාවලියේ අඩංගු විලාප - ගීතිකා වර්ග දෙක නම් කරන්න.

iv. පාපයේ ප්‍රතිඵල වශයෙන් දෙවිඳුන් ඒවාට දුන් දඬුවම් දෙකක් ලියන්න.

v. වීර නායකයන් දෙදෙනෙක් නම් කරන්න.

vi. ඊශ්‍රායෙලයේ රජවරුන් දෙදෙනෙක් නම් කරන්න.

vii. මුල් අගුණ පව් දෙකක් නම් කරන්න.

viii. දේව වරප්‍රසාද කොටස් දෙක නම් කරන්න.

ix. ශුද්ධ වූ අගොස්තීනු මුනිතුමාගේ ජීවිත වෙනසට මුල් වූ කරුණු දෙක ලියන්න.

x. ආරම්භක දේව ප්‍රසාද නිධාන දෙකක් නම් කරන්න.

02. i. පැරණි ගිවිසුමේ පොත් කාණ්ඩ දෙකක් නම් කරන්න.

ii. ඉන් එක් පොත් කාණ්ඩයක් සඳහා උදාහරණ තුනක් සඳහන් කරන්න.

iii. විශ්වාසය වර්ධනය කර ගැනීම සඳහා දේව වචනය ඉවහල් වන අවස්ථා පහක් ලියා දක්වන්න.

03. i. ශුද්ධවර මාක් හා ජොහාන් ශුභාරංචි රචිත කාලය සඳහන් කරන්න.

ii. ''මම වෙමි'' ප්‍රකාශන තුනක් ලියා දක්වන්න.

iii. ජේසුස් වහන්සේ වදාළ ''මම වෙමි'' ප්‍රකාශ ඔබේ කිතුනු දිවි පැවැත්මට මඟ පෙන්වන ආකාර පහක් විස්තර කරන්න.

04. i. ආදම් සහ ඒවාට ලද දරුවන් දෙදෙනා නම් කරන්න.

ii. වරදට වැටුණු කායින්ට දෙවිඳුන් දුන් දඬුවම් තුනක් ලියා දක්වන්න.

iii. වර්තමාන සමාජයේ දක්නට ලැබෙන පාපී ක්‍රියාවන්ගෙන් ඈත්ව දෙවිඳුන්ට ප්‍රසන්න ජීවිතයක් ගතකිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියන්න.

05. i. ඊශ්‍රායෙල් ජනයාට පීඩා කළ ජන වර්ග දෙකක් නම් කරන්න.

ii. සාමුවෙල් නම් විනිශ්චයකාරයා විසින් සිදුකරන ලද සේවාවන් තුනක් ලියන්න.

iii. නායකයකු වීමට බලාපොරොත්තුවෙන් සිටින අයකුට වීර නායකයන්ගෙන් ගතහැකි ආදර්ශ පහක් ලියා දක්වන්න.

06. i. කර්ම පාපය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

ii. **මහෝපදේශයට** අනුව ශුද්ධාත්මයාණන්ට විරුද්ධ ක්‍රියා තුනක් ලියන්න.

iii. දෙවිඳුන් අත්හැර පාපයට වහල් වූ මිතුරෙකුට දේව වරප්‍රසාදය සහිත ශුද්ධවන්ත ජීවිතයක් ගතකිරීම සඳහා ඔබ කරන යෝජනා පහක් සඳහන් කරන්න.

07. i. පාපයට ලැබෙන දඬුවම් වර්ග දෙක නම් කරන්න.

ii. සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය මගින් පාපයට සමාව ලබා ගැනීමට කළයුතු කාර්යයන් තුනක් ලියා දක්වන්න.

iii. ගිලිහී ගිය දේව සබඳතාවය යළි ගොඩනගා ගැනීම සඳහා සිදුකරන පාපොච්චාරණය කිරීමේ පිළිවෙතෙහි පියවරයන් අනුපිළිවෙලින් ලියන්න.